*සැ. යු.* - 2023.12.15 දින පළ කරන ලද අංක 2363 *ගැසට් පත්‍රයේ* III කොටස පළ නොවීය.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 2,364 - 2023 දෙසැම්බර් මස 22 වැනි සිකුරාදා - 2023.12.22**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (අ) වැනි කොටස - පළාත් සභා

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව |
|---|---|
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය ... ... | — |
| ආණ්ඩුකාරවරුන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... ... | — |
| වෙනත් පත්කිරීම් ... ... ... ... | — |
| පළාත් සභා නිවේදන ... ... ... ... | 5080 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| තනතුරු ඇබෑර්තු ... ... ... ... | — |
| විභාග විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් ... ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... ... | — |
| තොටුපළ් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... ... | — |


### සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2024 ජනවාරි මස 12 වැනි දින පළකරන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2023 දෙසැම්බර් මස 29 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගනුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*"යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළ කළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණ කර ඇත්තාක් සේ සැලකිය යුතු ය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2023 ජනවාරි මස 02 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# පළාත් සභා නිවේදන

## උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය -

### විෂයභාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්ති ප්‍රකාරව බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍යය ඉටුකරන තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අළුත් තක්සේරුවක් හෝ සත්‍යාක්ෂණයක් කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබා ගත යුතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වගන්තිය ප්‍රකාරව තිරප්පනේ බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපල මත අලුත් තක්සේරුවක් හා සත්‍යාක්ෂණයක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අලුත් තක්සේරුවක් හා සත්‍යාක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත,
අනුරාධපුර.

2023 අගෝස්තු මස 16 වැනි දින,
උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

12-654/1

---

## උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය -

### වරිපනම් ප්‍රතිශතය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර තිරප්පනේ බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුලත පිහිටියා වූ දේපල මත වාර්ෂික වටිනාකමින් සියයට හයක (6%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීම සඳහා තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්ය කර්තව්‍ය ඉටු කරන තිරප්පනේ ප්‍රාදේශීය සභාවේ ලේකම් එම්. ඩබ්. මේනක ප්‍රේමලාල් ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත,
අනුරාධපුර.

2023 අගෝස්තු මස 16 වැනි දින,
උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

12-654/2

---

## උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය -

### වරිපනම් ප්‍රතිශතය සඳහා අමාත්‍යවරයාගේ අනුමැතිය ලබාගැනීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තිය සමග කියවිය යුතු එම පනතේ 134(1) උපවගන්තියෙන් ලේකම් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර තලාව බල ප්‍රදේශයේ දියුණුකළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපල මත වාර්ෂික වටිනාකමින්

සියයට හතක (7%) වාර්ෂික වරිපනම් බද්දක් පනවා අය කිරීම සඳහා තලාව ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන කාර්යය කර්තව්‍යය ඉටුකරන තලාව ප්‍රාදේශීය සභාවේ ලේකම් අභයරත්න මුදියන්සේලාගේ අනුෂා සේනානි කුමාරි රත්නායක ගෙන ඇති තීරණය අනුමත කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.

2023 අගෝස්තු මස 16 වැනි දින,
උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

12-578/1

---

**උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය -**

විෂයභාර අමාත්‍යවරයාගේ විධානය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 9(3) වගන්තියෙන් බලතල ක්‍රියාත්මක කරන කාර්යය, කර්තව්‍යය ඉටු කරන තලාව ප්‍රාදේශීය සභාවේ ලේකම්වරයා විසින් අළුත් තක්සේරුවක් හෝ සත්‍යක්ෂණයක් කිරීමට 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146(1) වන වගන්තිය ප්‍රකාරව පළාත් පාලන විෂයභාර අමාත්‍යවරයාගේ විධානය ලබා ගත යුතු බවට තීරණය කර ඇත.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වගන්තිය ප්‍රකාරව තලාව බල ප්‍රදේශයේ දියුණු කළ ප්‍රදේශය ඇතුළත පිහිටියා වූ දේපල මත අලුත් තක්සේරුවක් හා සත්‍යක්ෂණයක් කිරීමට 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශාංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 146 (1) වන වගන්තියෙන් පැවරී ඇති බලතල ප්‍රකාරව, උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර මහීපාල හේරත් වන මා විසින් තලාව ප්‍රාදේශීය සභාවේ වරිපනම් දේපළ මත අලුත් තක්සේරුවක් හා සත්‍යක්ෂණයක් සඳහා විධානය කරනු ලබන්නේය.

මහීපාල හේරත්,
ආණ්ඩුකාරවර,
පළාත් පාලන විෂයභාර අමාත්‍ය,
උතුරු මැද පළාත,
අනුරාධපුර.

2023 අගෝස්තු මස 16 වැනි දින,
උතුරුමැද පළාත් ආණ්ඩුකාරවර කාර්යාලය.

12-578/2

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.